# 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා පොදු උපදෙස් නියමයන් හා කොන්දේසි මහජන ආරක්ෂක අමාත්‍යාංශය

1. 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් පහත වෙබ් අඩවි මඟින් 2023.11.23 දින සිට 2023.12.22 දින දක්වා අය කිරීමකින් තොරව බාගත කිරීම (Download) කර ගත හැකිවේ.
   **www.pubsec.gov.lk / www.police.lk / www.drp.gov.lk / www.immigration.gov.lk / www.ngosecretraiat.gov.lk / www.nddcb.gov.lk**

2. සැමවිටම නිවැරදි තොරතුරු පමණක් සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ වැදගත් තොරතුරක් සාවද්‍ය බවට පෙනී යන්නේනම් එවැනි අයදුම්කරුවෙකු ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබනු ඇත. අසම්පූර්ණ හෝ අපහැදිලි අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. අයදුම්පතට ඇමිණිය යුතු සියලු ලිපි ලේඛණ අනුක්‍රමිකව අංකනය කළ යුතුය. මුළු පිටු සංඛ්‍යාව ප්‍රධාන අයදුම්පතෙහි දකුණුපස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

**අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ලිපි ලේඛණ පහත පරිදි වේ.**

ඇ. නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්.

(i) සීමිත වගකීම් සහිත සමාගම් - සංග්‍රාමික සංස්ථා පත්‍රය.
(Memorandum of Association හෝ Articles of Association පිටපතක් ඇමිණිය යුතුය.)

(ii) වෙනත් ආයතන - ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය.
(තනි පුද්ගල හා හවුල් ව්‍යාපාර)

ආ. විදේශ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම දේශිය නියෝජිතයින් මඟින් සිදු කිරීමේ දී ප්‍රධාන ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරියා විසින් අත්සන් කරන ලදුව අදාළ රටෙහි නීතිඥවරයෙකු විසින් හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සත්‍ය බවට සහතික කරන ලද ඇටෝර්නි බලයෙහි මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.

මෙම ඇටෝර්නි බලයෙහි වලංගු සීමාව පැහැදිලිව සඳහන් කළ යුතු අතර ඒ කාල සීමාවට 2024.01.01 දින සිට 2024.12.31. දින දක්වා කාල පරිච්ඡේදය ඇතුලත් විය යුතුය. ෆැක්ස් , ස්කෑන් හෝ වෙනත් ක්‍රමවේද යටතේ එවනු ලබන ඇටෝර්නි බලපත්‍ර පිළිගනු නොලැබේ . (මුල් පිටපත ආපසු අවශ්‍ය නම් එහි පිටපතක් සමඟ ඉල්ලීමක් කරන්න.)

ඇ. කාණ්ඩ ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපත (ලංකා බැංකුව මඟින් නිකුත් කරන ලද) අනිවාර්යයෙන් ඇමිණිය යුතුය.

4. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවශ්‍ය සියලු ලිපි ලේඛණ පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි 2023. 12.22 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැල මඟින් එවිය යුතුය.

ප්‍රධාන ගණකාධිකාරි ,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
17 මහල ,
සුහුරුපාය,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.

දේශීය අයදුම්කරුවන්ට අදාළව අයදුම්පත බහා ලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ " සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2024 (දේශීය)" යනුවෙන් සඳහන් තළ යුතු අතර , විදේශීය සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ දේශීය නියෝජිතයන් "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2024 (විදේශීය) " යනුවෙන් සඳහන් කළ යුතුය.

<u>අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්</u>

5. එක් එක් කාණ්ඩය සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් ශ්‍රී ලංකා රු.1,800.00 ක ගාස්තුවක් අය කෙරෙන අතර විදේශ අයදුම්කරුවන්ගෙන් මේ සඳහා අය කෙරෙන මුදල ඇමරිකානු ඩොලර් 10 ක් වේ. දේශීය නියෝජිතයන් මඟින් ගෙවීම් කිරීමේදී එක් කාණ්ඩයක් වෙනුවෙන් අය කරන මුදල රු. 3,600.00 කි.

දේශීය අයදුම්කරුවකු ( බොහෝ විට දේශීය නියෝජිතයෙකු ) එක් ප්‍රධාන ආයතනයකට වැඩියෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරන්නේ නම් එබඳු එක් එක් ප්‍රධානියා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ( මුදල් තැන්පත්කිරීමේදී ගිණුම් හිමියාගේ නම ලෙස, "මහජන ආරක්ෂක අමාත්‍යාංශය " යනුවෙන් සඳහන් කර තැන්පතු පත්‍රිකාවේ ''Suppliers Registration Category fee - 2024 " යනුවෙන් සඳහන් කිරීම අනිවාර්ය වේ.)

6. ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ '' ලේකම් ,මහජන ආරක්ෂක අමාත්‍යාංශය - 7040131 " දරණ ගිණුමට බැර වන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් කාණ්ඩ ගාස්තු මුදල් ගෙවිය හැකිය. ( ඔබගේ අනන්‍යතාවය තහවුරු වන පරිදි ඔබගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය මුදල් තැන්පතු පත්‍රිකාවේ නිවැරදිව සටහන් කිරීම අනිවාර්ය වේ.) විදේශ සැපයුම්කරුවන්හට (දේශීය නියෝජිතයන් නොමැති විට) කාණ්ඩ ගාස්තු ගෙවීම එක් කාණ්ඩයක් යටතේ ලියාපදිංචි වීම සඳහා ඇමරිකානු ඩොලර් 10 ක් වශයෙන් Swift Code භාවිතයෙන් ඕනෑම රටකදී ඕනෑම බැංකුවකින් ලංකා බැංකුව වෙත පහත ආකාරයට ගෙවිය හැකිය.

| | | |
|---|---|---|
| Swift Code | - | BCEYLKLX |
| Bank Code | - | 7010 |
| Branch Code | - | 679 |
| Account No | - | 7040131 |

7. යම්අයදුම්කරුවෙකු විසින් ගෙවන ලද කාණ්ඩ ගාස්තු නැවත ගෙවනු නොලැබේ. අයදුම්කරුගේ අතපසුවීමකින් හෝ නොසැලකිලිමත්කමින් යම් තොරතුරක් ඉල්ලා ඇති ලේඛණයක් ඉදිරිපත් නොකිරීම, වැරදි කාණ්ඩ ලකුණු කර තිබීම යන හේතු මත අයදුම්පත ප්‍රතික්ෂේප වන අතර එවැනි අවස්ථාවක වුවද කාණ්ඩ ගාස්තු ආපසු ගෙවීමක් සිදු නොවන බව දන්වනු ලැබේ.

8. අයදුම්පතෙහි ප්‍රශ්නයක් ඉදිරියෙහි ඊට උචිත ආකාරයට '' ඔව් / නැත" යන්න කපා හරින්න.

9. අයදුම්කරුට අදාළ නොවන කවර හෝ අයිතමයක් ඉදිරියෙන් අදාළ නොවේ යන්න සටහන් කරන්න .

10. ලියාපදිංචි කිරීමෙන් පසුව යම් සමාගමක (දේශීය / විදේශීය) තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදු වුවහොත් එම ඉල්ලීම සලකා බලනුයේ එම ඉල්ලීම එකී සංශෝධනයට සම්බන්ධ අදාළ සමාගම ( දේශීය /විදේශීය ) මගින් නිකුත් කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණි.

11. ලියාපදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ හෝ <u>කාණ්ඩ වර්ගයෙහි</u> කිසිඳු වෙනසක් සිදු කළ නොහැකි බව හා කාණ්ඩ අතර මාරු කිරීම්ද සිදු නොවන බව කරුණාවෙන් සලකන්න.

12. අයදුම්කරුගේ යම් ප්‍රමාද දෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශය වගකීම බාර ගනු නොලැබේ.

13.2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් පහත නිළධාරින් අමතන්න.

ගණකාධිකාරි
දුරකථන අංකය :- 0112887328 (කාර්යාල වේලාව තුළ පමණි)
ෆැක්ස් :- 0112887916
විද්‍යුත් ලිපිනය :- www.caminlofinance@gmail.com

14. රජයේ ප්‍රසම්පාදන උපදෙස් 2006 (භාණ්ඩ හා වැඩ) මත 8.11.5 ඇ දරණ වගන්තියේ උපදෙස් ප්‍රකාරව කොන්දේසි පැහැරහැරී කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැයිස්තුවෙහි නම් සඳහන් සැපයුම්කරුවන්ට ලියාපදිංචි වීම සඳහා අවසර දෙනු නොලැබේ.

15. මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වන අවස්ථාවේදී එක් මසක ණය පහසුකම් සැපයීමට සියලු සැපයුම්කරුවන් ස්වයංක්‍රීයවම එකඟ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ එකඟ නොවන සැපයුම්කරුවන් ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ .

16. අමාත්‍යාංශ අවශ්‍යතා මත ලියාපදිංචි වු සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍ය පරිදි මිළ ගණන් කැඳවනු ලැබේ. එසේ වුවද අවශ්‍ය අවස්ථාවන්හීදි සැපයුම්කරුවන් තෝරාගැනීමේ සම්පූර්ණ අයිතිය මහජන ආරක්ෂක අමාත්‍යාංශය සතුවේ.

17. 2024 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.